# ආගමන සමයේ පළමුවන සතිය
## අඟහරුවාදා

පළමුවන දේව ප්‍රකාශනය යෙසායා 11: 1-10

යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

*ස්වාමින් වහන්සේගේ ශුද්ධාත්මය එතුමන් මත පතිත වන්නේය.*

"දාවිත්ගේ රජ පෙළපත නමැති වෘක්ෂයෙන් රාජාංකුරයක් හට ගන්නේය. එහි මුල්වලින් අළුත් පැළයක් නැගී එන්නේය. සමිඳුන්ගේ ආත්මානුභාවය වන ප්‍රඥාව හා නුවණ ද අනුශාසනා බුද්ධිය හා බලය ද දැන ගැනීම හා දේව ගරු බිය ද එතුමාණන් කෙරෙහි පිහිටන්නේ ය. එතුමන්ට ගරු බිය පැම එතුමාණන්ගේ ප්‍රීතිය වන්නේය. එතුමාණන් තමන් ඇසට පෙනෙන හැටියට විනිශ්චය කරන්නේ වත්, කනට ඇසෙන හිටියට විනිශ්චය කරන්නේ වත් නැත.

එතුමාණෝ යුක්ති සහගත ලෙස දුප්පතුන් විනිශ්චය කොට යටහත් පහත් අයට තමන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන සේක. එතුමාණෝ තමන්ගේ ආඥා යෂ්ටියෙන් දේශයට පහර දෙන සේක. වචනයකින් දුෂ්ඨයෝ මිය යන්නෝ ය. යුක්තිය එතුමාණන්ගේ ඉඟ පටිය ද විශ්වාසකම බඳ පටිය ද වනු ඇත. වෘකයා බැටළුවා සමඟ වාසය කරන්නේ ය. දිවියා එළු පැටවා සමඟ ලගින්නේ ය. සිංහ පැටියා ද වහු පැටියා ද එකට කෑම කන්නෝය. කුඩා දරුවෙක් උන් ගෙන යන්නේ ය. එළදෙන හා වළසා එක්ව තණ කන්නෝ ය. උන්ගේ පැටව් එකට ලගින්නෝ ය. සිංහයා හරකා පිට සෙල්ලම් කරන්නේය. සිඟිති දරුවා පොළඟාගේ ගුල පිට අත තබන්නේය. සමිඳාණන් වහන්සේගේ ශුද්ධ කන්දේ සීමාව තුළ කිසි නපුරක් වත්, අනතුරක් වත් නොවන්නේය. මුහුද ජලයෙන් පිරී තිබෙන්නාක් මෙන් සමිඳාණන් වහන්සේ පිළිබඳ දැන ගැන්මෙන් පොළොව පිරී යන්නේය.

දාවිත් රජුගේ වංශයෙන් උද්ගත වන රජතුමා ජාතීන් හට සංඥාවක් වන කාලය පැමිණෙන්නේය. ජාතීහු එතුමන් සොයා යන්නෝය. එතුමන්ගේ වාසභවනය මහිමයෙන් පිරී යන්නේය.

*දේව වචනය මෙසේ ය.*

| පිළිතුරු ගීය | ගීතාවලිය 72: 1–2, 7–8, 12–13, 17 |
|---|---|

පිළිතුර: සදහටම දමිටු බව දියුණු වී සාමය පැතිරේවා!

ගීය: දෙවිඳුනි, රජතුමාට විනිශ්චය කිරීමේ ඥානය දුන මැනව.
ඒ රජ කුමරු හට යුක්තිගරුකව ක්‍රියා කිරීමේ හැකියාව දුන මැනව.
එවිට එතුමා ඔබේ ජනතාව සාධාරණ ලෙස පාලනය කරන්නේය.
ඔබේ පීඩිත ජනතාවට යුක්තිය ඉටු කරන්නේය.

එතුමන් සමයෙහි දමිටු බව දියුණු වේවා!
ඉර හඳ පවතින තෙක් සාමය පැතිරේවා!
මුහුදින් මුහුදට එතුමාගේ රජ දහන පැතිරේවා!
යුප්‍රටීස් නදියේ සිට පොළොවේ කෙළවර දක්වා එසේම වේවා!

එතුමා සරණ පතා මොරගසන අසරණයන් මුදා ගන්නේය.
පිහිට නැති පීඩිතයන් ද නිදහස් කර ගන්නේය.
එතුමා දුගී දුප්පතුන්ට හා දුබලුන්ට අනුකම්පා කරන්නේය.
දිළිඳුන්ගේ ජීවිත මුදා ගන්නේය.

එතුමාගේ නාමය සදහටම පවතීවා!
ඉර හඳ පවතින තෙක් එතුමාට කීර්තිය අත් වේවා!
එතුමා අතින් සව්සත ආසිරි ලබත්වා!
එතුමාට ආසිරි දෙන ලෙස දෙවිඳුන් අයදිත්වා!
සියලු ජාතීහු එතුමාට සව්සිරි සැප පතත්වා!

| සුපුවත් ජය නද |
|---|

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබ තිර පෙම අපට පෙන්නුව මැනව.
ගැළැවීමේ පිහිට අපට ද දානය කළ මැනව.
ආලේලූයා!

| සුවිශේෂය | ලූක් 10 : 21–24 |
|---|---|

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

*ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ සේක.*

ඒ පැයේදීම උන්වහන්සේ ශුද්ධාත්මයෙන් පූර්ණ වී උදන් අනමින්, “ස්වර්ගයටත් පොළොවටත් අධිපති වූ පියාණෙනි, ඔබ මේ දේවල් පැණවතුන් හා නැණවතුන් කෙරෙන් ආවරණය කොට බාලයන්ට අනාවරණය කළ බැවින් ඔබට තුති පුදමි. එසේය, පියාණෙනි, ඔබට ප්‍රිය මනාප වූයේත් එය මය. මාගේ පියාණන් වහන්සේ සියල්ලම මට පවරා දී තිබේ. පුත්‍රයාණෝ කවරෙක්දැයි පියාණන් වහන්සේ හැර අන් කිසිවෙක් නොදනිති. එසේම පුත්‍රයාණනුත් පුත්‍රයාණන් විසින් පියාණන් වහන්සේ එළිදරව් කිරීමට තෝරා ගනු ලැබූ අයත් හැර අන් කිසිවෙක් පියාණන් වහන්සේ කවරෙක් දැ යි නොදනිති”යි වදාළ සේක.

එවිට උන්වහන්සේ ශ්‍රාවකයන් සමඟ තනියම සිටියදී ඔවුන්ට කතා කොට ඔබ නරඹන දේ දකිනා ඇස් භාග්‍යවන්ත ය, මෙය මම ඔබට කියමි, “ඔබ දකින දේ දකින්නටත් ඔබ අසන දේ අසන්නටත් බොහෝ දිවැසිවරයෝ ද රජවරු ද අපේක්ෂාවෙන් සිටියහ. එහෙත් ඔවුන් එය දුටුවේ වත් නැත. ඇසුවේ වත් නැතැ”යි වදාළ සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*